# සාරාංශය

මෙම පර්යේෂණයේ මාතෘකාව වන්නේ ''ඉගෙනුම් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමෙහි ලා ගුරුවරුන් විසින් පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප කෙතෙක් දුරට භාවිතා කරන්නේ ද යන්න විමසා බැලීම සඳහා කෙරෙන අධ්‍යයනයක්'' යන්නයි. මෙම අධ්‍යයනය කොළඹ අධ්‍යාපන කලාපයේ ජ්‍යෙෂ්ඨ ද්විතියික පන්ති ක්‍රියාත්මක වන 1AB හා 1C පාසැල් 10 ක් ඇසුරෙන් කරනු ලබන්නකි. ''පන්ති කාමරය වනාහි තමන් අදහන ශ්‍රේෂ්ඨ ආගම් කර්තෘවරුන් සුවඳ මලින් පිදෙන පූජාසනයක් වැනිය'' යන්න මූලික සත්‍යයකි. මේ සුවඳ මල් පරවී නොයන පූජාසන ගොඩ නඟන්නට ගුරු පරපුරට කළ හැකි මෙහෙවර ද නොනිමි කාර්යයකි. එහෙයින් ගුරු සේවාව කාර්යක්ෂම හා ඵලදායී ලෙස පවත්වා ගෙන යාමටත් උසස් ප්‍රමිතීන් කරා ළඟ වීමටත් නිරන්තර ප්‍රයත්නයක් ගුරුවරයෙකුට තිබිය යුතුමය. ගුරුවරයෙකු පාසල් දවසේ වැඩි කාලයක් ගත කරන්නේ පන්ති කාමරයේ දරුවන් අතර ය. පාසලේ කුමන පහසුකම් තිබුණ ද ගුරුවරයෙකු තෘප්තිමත් වන්නේ දරුවන්ගේ ජීවිත වලට ඵලදායි යමක් එකතු කළේ ද? යන්නට ලැබෙන සාර්ථක පිළිතුර මත ය. පන්ති කාමර කළමනාකරණය පිළිබඳ වෘත්තීය නිපුණතාවත් ඒ පිළිබඳ ප්‍රායෝගික ව්‍යවහාරයනුත් ගුරුවරයෙකුට අවශ්‍ය වන්නේ එම ප්‍රමිතිය කරා ළඟා වීමටයි. ඒ සඳහා ගුරුවරයා විසින් පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප භාවිතා කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වූයේ පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප සම්බන්ධයෙන් ගුරුවරුන් කෙතෙක් දුරට දැනුවත් ද යන්න විමසා බැලීම, ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන්ගේ ස්වයං අධ්‍යයන අවස්ථාවන් වර්ධනය කර ගැනීමට පන්ති කළමනාකරණ ක්‍රියාවන් ගුරුවරුන් විසින් කෙතෙක් දුරට දායක කර ගන්නේ ද යන්න විමසා බැලීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි දී පන්ති කාමර කළමනාකරණය ආශ්‍රිතව මතුවන ගැටලු පිළිබඳව විමසා බැලීම සහ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙහි දී පන්ති කාමර කළමනාකරණය ආශ්‍රිතව මතුවන ගැටලු සඳහා ගුරුවරුන් යොදා ගන්නා ක්‍රියා මාර්ග මොනවා ද යන්න විමසා බැලීම වේ.

මෙම අධ්‍යයනය සඳහා විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය භාවිතා කරනු ලැබිය. ඒ යටතේ එන සමීක්ෂණ පර්යේෂණ ක්‍රමය මෙහිදී උපයෝගි කර ගන්නා ලදී. අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීමට යොදා ගත් ප්‍රධාන උපකරණය වූයේ ගුරු නියැදියට හා සිසු නියැදියට ලබා දුන් ප්‍රශ්නාවලින් ය. ස්ථරගත අහඹු නියැදිකරණයට අනුව තෝරාගත් ගුරුවරුන් 100 දෙනෙකුට හා සිසුන් 100 දෙනෙකුට ප්‍රශ්නාවලි ලබා දීම මගින් අවශ්‍ය දත්ත ලබා ගැනීම සිදු කරන ලදී. නියැදියට අයත් ගුරුවරුන් අතරින් සියයට 10 ක් (10 දෙනෙකු) සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම තුළින් හා නිරීක්ෂණය මගින් ප්‍රශ්නාවලියට සපයා තිබූ පිළිතුරු කෙතෙක්

දුරට සත්‍ය ද යන්න තහවුරු කර ගන්නා ලදී. මෙසේ රැස් කර ගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා සංඛ්‍යා වගු සටහන්, ප්‍රතිශත හා විස්තරාත්මක ප්‍රකාශනයන් ප්‍රයෝජනයට ගනු ලැබීය. අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු ඔස්සේ දත්ත විශ්ලේෂණය කර ඇත. එසේ ප්‍රධාන අරමුණු ඔස්සේ විශ්ලේෂණය කරන ලද දත්තයන් පාසල් වර්ගය (1AB හා 1C වශයෙන්), ස්ත්‍රී පුරුෂභාවය හා සේවා කාලය අනුව කිසියම් වෙනසක් තිබේ ද යන්න තවදුරටත් විශ්ලේෂණය කර ඇත.

මෙම අධ්‍යයනයේ දී සමස්ත නියැදියට අයත් ගුරුවරුන් දක්වා තිබෙන ප්‍රතිචාරවලට අනුව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙ "දී පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප පිළිබඳ ගුරුවරුන්ගේ න්‍යායික දැනුවත්භාවයට වඩා පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප ප්‍රායෝගිකව භාවිතා කිරීම ඉහළ මට්ටමක පවතින  බව පැහැදිලි විය. පාසල් වර්ගය අනුව මේ පිළිබඳ ගුරුවරුන් දක්වා තිබෙන ප්‍රතිචාරවල යම් වෙනසක් තිබේ. දත්ත විශ්ලේෂණයට අනුව 1AB පාසල්වල ගුරුවරුන්ගේ ප්‍රායෝගික පන්ති කාමර ව්‍යවහාරයන් සම්බන්ධයෙන් අනෙක් පාසල්වල ගුරුවරුන්ට වඩා වැඩි එකඟතාවයක් තිබෙන බව පෙන්නුම් කරයි. සේවා කාලය අනුව ද මේ සම්බන්ධයෙන් ගුරුවරුන් අතර වෙනස්කම් දක්නට ලැබුණි. සේවා කාලය වැඩිවත්ම පන්ති කාමර කළමනාකරණ ව්‍යවහාරයන්  වඩාත් ඉහළ මට්ටමක පවතින බව පැහැදිලි විය.

පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප පිළිබඳ ගුරුවරුන් කෙතෙක් දුරට දැනුවත් ව සිටින්නේ ද යන්න විමසා බැලීමට ඉදිරිපත් කළ ප්‍රකාශනයන්ට සමස්ත ගුරු නියැදියෙන් සියයට 71'8 ක් ලකුණු 50 ට වඩා අඩුවෙන් ලබා තිබීමෙන්, පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප පිළිබඳ ගුරුවරුන්ගේ න්‍යායික දැනුවත්භාවය පහළ මට්ටමක පවතින බව පෙන්නුම් කෙරිණි. පාසල් වර්ගය, ස්ත්‍රී පුරුෂභාවය  හෝ සේවා කාලය අනුව මේ සම්බන්ධයෙන් දක්වා තිබෙන ප්‍රතිචාරවල වෙනස්කම් දක්නට නොලැබුණි. පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප ප්‍රායෝගිකව පන්ති කාමරය තුළ භාවිතා කරන්නේ ද යන්න විමසා බැලීමට ඉදිරිපත් කළ ප්‍රකාශනයන්ට ගුරු නියැදියෙන් සියයට 72.8 ක් ලකුණු 50 ට වඩා වැඩියෙන් ලබා තිබිණි. පාසැල් වර්ගය, ස්ත්‍රී පුරුෂභාවය හා සේවා කාලය අනුව ද මේ සම්බන්ධයෙන් දක්වා තිබෙන ප්‍රතිචාරවල කිසියම් වෙනසක් තිබෙන බව දත්ත විශ්ලේෂණයේ දී පැහැදිලි විය.

''ඉගෙනුම් -'' ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන්ගේ ස්වයං අධ්‍යයන අවස්ථාවන් වර්ධනය කර ගැනීමට පන්ති කාමර කළමනාකරණ ක්‍රියාමාර්ග ගුරුවරුන් විසින් කෙතෙක් දුරට දායක කර ගන්නේ දැයි විමසා බැලීමට ඉදිරිපත් කළ ප්‍රකාශන සඳහා සමස්ත නියැදියෙන් සියයට 67.0 කට වඩා එකඟත්වය දක්වා තිබුණි. පාසැල් වර්ගය, ස්ත්‍රී පුරුෂභාවය, හා සේවා කාලය අනුව ද මේ ප්‍රතිචාරවල වෙනස්කම් පැවතිණි. 1C පාසැල්වල ගුරුවරුන්ට වඩා 1AB පාසල් වල ගුරුවරුන් ද ගුරුවරුන්ට සාපේක්ෂව ගුරුවරියන් ද ස්වයං අධ්‍යයන අවස්ථා පිළිබඳ අවබෝධයෙන් පසුවන බව පෙන්නුම් කෙරිණි.

''ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේදී පන්ති කාමර කළමනාණාකරණය ආශ්‍රිතව ගුරුවරුන් මුහුණ දෙන ගැටලු'' පිළිබඳව සොයා බැලීමට ඉදිරිපත් කළ ප්‍රකාශනයන්ට ගුරු නියැදියෙන් සියයට 70 කට වඩා ගැටලු පවතින බවට එකඟතාව දක්වා තිබුණි. පාසල් වර්ගය, ස්ත්‍රී පුරුෂභාවය හා සේවා කාලය අනුව මේ සම්බන්ධයෙන් එකඟවීමේ ස්වභාවයෙහි වෙනසක් දැකිය නොහැකිය.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පන්ති කාමර කළමනාකරණය ආශ්‍රිතව ගුරුවරුන් මුහුණ දෙන ගැටලු සඳහා ඔවුන් විසින් යොදා ගනු ලබන විසඳුම් පිළිබඳව සොයා බැලීමට ඉදිරිපත් කළ විසඳුම් සහිත ප්‍රකාශනයන්ට ගුරු නියැදියෙන් සියයට 59.0ක් පමණ එකඟතාව දක්වා තිබීමෙන් පන්ති කළමනාකරණයේ දී මතුවන ගැටලු සඳහා විසඳුම් යොදා ගැනීම එතරම් දුරට සතුටුදායක මට්ටමක පවතින බව නොපෙනුණි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමෙහි ලා ගුරුවරුන් විසින් පන්ති කාමර කළමනාකරණ ක්‍රමශිල්ප භාවිතය පිළිබඳව සෑහීමකට පත් විය හැකි බව දත්ත විශ්ලේෂණය අනුව නිගමනය කළ හැකි විය. මෙහිදී න්‍යායික දැනුවත්භාවයට සාපේක්ෂව ප්‍රයෝගික ව්‍යවහාරයන් ඉහළ මට්ටමක පවතී. සිසුන්ගේ ස්වයං අධ්‍යයන අවස්ථා පිළිබඳ ගුරුවරුන්ගේ අවබෝධය පුළුල් මට්ටමක පවතින අතර පන්ති කාමරයේදී ඔවුන් මුහුණ දෙන පන්ති කාමර කළමනාකරණ ගැටලු ඊට බාධා වී ඇති බව පැහැදිළි විය.